# බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2014

## Competitive Examination for the Recruitment of Graduate teachers to fill vacancies under Ministry of Education (Western Province) - 2014

බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සුදුසුකම් :** මේ සඳහා පෙනී සිටින අපේක්ෂකයකු,

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. යහපත් චරිතයකින් හා මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

III. 2014-09-15 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම විභාගයෙන් කුසලතා මත පුරප්පාඩු ඇතිවන ආකාරයට ඉදිරියට බඳවා ගනු ලබන දිනට වයස අවුරු 45 නොඉක්මවා තිබිය යුතුය.) දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

IV. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම / විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක උපාධියක් ලබා තිබීම. (සහතිකය වලංගු දිනය 2014-09-15 දින හෝ ඊට පෙර විය යුතුය.)

- අ.පො.ස.(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 3 සහිතව, මව්බස හා ගණිතය ද ඇතුළත්ව විෂයන් 06 කින් සමත් වීම. (එක් වතාවකදී අවම වශයෙන් විෂයන් 05 ක් සමත් වී තිබිය යුතුය.)
- අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් 3කින් සමත් වීම.

V. 2014-09-15 දිනට පූර්වාසන්න වසර තුනක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

**02. බඳවා ගැනීමේ ක්‍රමය :** විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙළ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඒ අතරින් සුදුස්සන් තෝරාගනු ලැබේ. උපාධිධාරී ගුරු තනතුරුවල පුරප්පාඩු ඇතිවන පරිදි බඳවා ගැනීම් කරනු ලැබේ.

''විභාගයේ ප්‍රතිඵල අයදුම්කරුවන් වෙත දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් මගින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය ඔස්සේ හෝ සිදුකෙරෙනු ඇත.''

### I වන උපලේඛනය - සිංහල - ඉංග්‍රීසි /දෙමළ මාධ්‍ය පාසල්වල ගුරු පුරප්පාඩු

| ගුරු වර්ගය | විෂය අංකය | උපාධිය | උපාධිය හැදෑරූ මාධ්‍යය |
|---|---|---|---|
| කලා | 01 | ශාස්ත්‍රවේදී උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| වාණිජ්‍යය | 02 | වාණිජවේදී උපාධිය/විද්‍යාවේදී වාණිජ විෂය ධාරාවට අයත් උපාධි | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| විද්‍යාව | 03 | විද්‍යාවේදී උපාධිය/විද්‍යාව විෂයය ධාරාවට අයත් උපාධි | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| ගණිතය | 04 | ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය ප්‍රධාන විෂයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| තොරතුරු තාක්ෂණය | 05 | තොරතුරු තාක්ෂනය පිළිබඳ උපාධිය (IT) හෝ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් / (BSC Computer Science) ලබා | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| චිත්‍ර | 06 | තිබීම.<br>සෞන්දර්යය / ලලිතකලාවේදී උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (චිත්‍ර) උපාධිය හෝ මෝස්තර නිර්මාණය (චිත්‍ර විෂයය) පිළිබඳ | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| පෙරදිග සංගීතය | 07 | උපාධියක් ලබා තිබීම<br>සෞන්දර්යය / ලලිතකලාවේදී උපාධිය / ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (පෙරදිග සංගීතය) | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |

| ගුරු වර්ගය | විෂය අංකය | උපාධිය | උපාධිය හැදෑරූ මාධ්‍යය |
|---|---|---|---|
| බටහිර සංගීතය | 08 | සෞන්දර්යය / ලලිතකලාවේදී උපාධිය / ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (බටහිර සංගීතය) | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| නැටුම් | 09 | සෞන්දර්යය / ලලිතකලාවේදී උපාධිය / ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (නර්තනය) | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| නාට්‍ය හා රංග කලාව | 10 | නාට්‍ය හා රංග කලාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ නාට්‍ය හා රංග කලාව ප්‍රධාන විෂයයක් සහිතව ශාස්ත්‍රවේදී උපාධිය. | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| ඉංග්‍රීසි භාෂාව | 11 | ශාස්ත්‍රවේදී උපාධිය (ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා තිබිය යුතුය. | ඉංග්‍රීසි |
| සිංහල පාසල් සඳහා දෙවන භාෂාව (දෙමළ) | 12 | උපාධියට දෙමළ භාෂාව විෂයක් වශයෙන් සමත්වී තිබීම<br>සහ<br>අ.පො.ස.(සා.පෙළ) සිංහල විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස(උ.පෙළ) විභාගයේදී සිංහල භාෂාව සමත් වී තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජය පිළිගත් ආයතනයක මාස 6 කට නොඅඩු සිංහල භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක්/ පාඨමාලාවක්/ සහතිකයක් ලබා තිබීම.<br>(සිංහල කථා කිරීමේ හැකියාව තිබිය යුතුය) | දෙමළ |
| දෙමළ පාසල් සඳහා දෙවන භාෂාව (සිංහල) | 13 | උපාධියට සිංහල භාෂාව විෂයක් වශයෙන් සමත් වී තිබීම.<br>සහ<br>අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී දෙමළ භාෂාවට සම්මානයක් ලබා තිබීම හෝ අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී දෙමළ භාෂාව සමත් වී තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජය පිළිගත් ආයතනයක මාස 6 කට නොඅඩු දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක්/ පාඨමාලාවක්/ සහතිකයක් ලබා තිබීම.<br>(දෙමළ කථා කිරීමේ හැකියාව තිබිය යුතුය.) | සිංහල |

මෙම විභාගය කොළඹ, ගම්පහ, කළුතර යන නගර තුළ පමණක් පැවැත්වේ.

**03. විභාග මාධ්‍ය හා විභාග ක්‍රමය**

මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ.

3.1 සිංහල මාධ්‍යය ගුරු තනතුරු අපේක්ෂිත අයදුම්කරුවන් සිංහල මාධ්‍යයෙන්ද,

3.2 දෙමළ මාධ්‍යය ගුරු තනතුරු අපේක්ෂිත අයදුම්කරුවන් දෙමළ මාධ්‍යයෙන්ද,

3.3 ඉංග්‍රීසි මාධය ගුරු තනතුරු අපේක්ෂිත අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටිය යුතුයි. (ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය හදාරා තිබීම අනිවාර්ය වේ.)

3.4 දෙවන භාෂාව (සිංහල / දෙමළ) ගුරු තනතුරු අපේක්ෂිත අයදුම්කරුවන්ට තම මවු භාෂාවෙන් විභාගයට පෙනී සිටිය හැකිය.

3.5 විෂය නිර්දේශය

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍ර දෙකම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න වලින් සමන්විත වේ. තරඟ විභාගයේදී එක් එක් විෂයයක් සඳහා ලබා ගත යුතු අවම ලකුණු සංඛ්‍යාව 40% කි.

1. අභියෝග්‍යතාව - කාලය පැය 1 යි (ලකුණු 100 යි)

(අපේක්ෂකයාගේ භාෂා හැකියාව නර්තන ශක්තිය හා ගණිතමය කුසලතා පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.)
බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

2. සාමාන්‍ය දැනීම - කාලය පැය 1 යි (ලකුණු 100 යි)

ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සංස්කෘතික, සමාජීය, විද්‍යාත්මක හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත්වන්නා වූ තොරතුරු මෙන්ම කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.
(බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**04. සේවා කොන්දේසි**

4.1 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය (2007-08-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(iv) අනුව, ටී.එස්. 2-2006-A) රු. 14,135 - 180×9-240×6-330×5-400×7-645×13-රු.30,030/-ක් වේ. මෙම වැටුප් පරිමාණයේ 8 වන පියවර වන රු. 15395/- ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
4.3 උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.

**05. අයදුම් කිරීමේ ක්‍රමය**

5.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා ම පිරවිය යුතුය. 1.0 සිට 3.4 තෙක් වන ශීර්ෂ 1 පිටුවේ ද, 4.0 සිට 7.0 වන තෙක් 2 වන පිටුවේ ද වන පරිදි තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. මෙහිදී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ.

5.2 විභාග ගාස්තුව රු. 400/- කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැළවෙන සේ අලවා එවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ අංක 20 03 02 99 ආදායම් ශීර්ෂයට බැර වන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

5.3 අයදුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණකොට ඉදිරිපත් කළ යුතුය.

5.4 අයදුම් කරනු ලබන ගුරුවර්ගයට අදාළ සංකේත අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය. ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා සලකා බලනු නොලැබේ. එසේම එක් අපේක්ෂකයකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

5.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාර වරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු රු. 240360/- ට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ සංස්ථාපිත මණ්ඩලයක ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

5.6 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2014-09-15 දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගය - 2014'' යනුවෙන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

5.7 තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

**06. විභාගයට ඇතුළුවීම**

6.1 අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එහිදී ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබාගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත ඔබගේ විස්තර ඇතුලත් ඉල්ලීම් ලිපියක් දැක්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීමද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

6.2 අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

6.3 අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

6.4 මෙම නිවේදනය අනුව අයදුම්කරුවන් සියලු සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත සියලුම අයදුම්කරුවන්ට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ ලබාදෙනු ලැබේ.

07. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

**08. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :** තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත.

I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**09. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

9.1 අපේක්ෂකයකුට සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයක දී හෝ විභාගයෙන් පසුව ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

9.2 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතියද, කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින් ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

වී. රාජපක්ෂ,
ලේකම් / පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)
නො. 532/7, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

2014-08-08 දින